**කඩුගන්නාව නගර සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කඩුගන්නාව නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මැංගුස්වත්ත ඉඩම සංවර්ධනය සඳහා රු.250,000 ක් වියදම් දරා තිබුණද එය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ගෙවීම් කරන බැවින් එහිදී ප්‍රාග්ධනිත කිරීමට සටහන් කර ගත් බව. | දේපල සංවර්ධනයට වැය කළ මුදල් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කලයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනවසර ඉදිකිරීම්, කඩ කුලී නොගෙවීම් සම්බන්ධයෙන් සභාවට එරෙහිව නඩු 08 ක් පවරා තිබුණු අතර ඒ පිළිබඳ තොරතුරු ගිණුම් තුළ හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නඩු හෙළිදරව් කිරීමක් සිදුකරන බව. | මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කලයුතු කරුණු හෙළිදරව් කලයුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 06 ට අදාළ මුද්දර ගාස්තු හා දෙසැම්බර් මාසය සඳහා වූ උසාවි දඩ ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පුරෝකථනයක් සිදු කිරීම කල නොහැකි බැවින් වර්ෂය තුළ ලැබී ඇති ප්‍රමාණය පමණක් ගිණුම්ගත කර ඇති බව. | සභාව වෙනුවෙන් එම ආදායම් රැස්කරන ආයතන වෙතින් විමසා බලා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,367,771 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.458,299 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| (i) | ප්‍රදේශයේ නව ඉදිකිරීම් තක්සේරු කර බදු අය නොකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු රු.2,642,028 ක ආදායමක් අහිමි වී තිබුණි. | නිසි කලට වරිපනම් ගෙවන ලෙසට දන්වා කඩිනමින් අයකර ගැනිමට කටයුතු යොදා ඇති බව. | නව ඉදිකිරීම් තක්සේරු කර බදු අය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | වර්ෂ 05 කට වරක් වරිපනම් බදු තක්සේරු කළ යුතු වුවද නගර සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු 2012 වර්ෂයේදී කළ තක්සේරු අගය මත අයකරමින් පැවතුණි. | තක්සේරුව සඳහා වසර 05ක් ගතවීමට පෙරාතුව 2016 වර්ෂයේදි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නව තක්සේරුවක් සඳහා ඉල්ලීම් කර ඇති බව. | වර්ෂ 5 කට වරක් වරිපනම් බදු තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වෙනත් බදු<br>කඩුගන්නාව තානායමේ බදු ගිවිසුම 2019 අප්‍රේල් 30 දින සිට අහෝසි කර තිබුණද බදුකරුගෙන් අයවිය යුතු රු.293,629 ක හිඟ මුදල් හා විසන්ධි කර ඇති ජල සැපයුම නැවත සන්ධි කිරීමේ ගාස්තුව වූ රු.8,100 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම හිඟ මුදල් නගර සභාවට අයකර දෙන ලෙස මධ්‍යම පළාත් නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂක විසින් කටයුතු කරමින් සිටින බව. | අයවිය යුතු හිඟ බදු මුදල් හා ජල බිල්පත් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 2.2.2 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.739,094 ක හිඟ කඩ කුලී ශේෂයක් පැවති අතර ඒ තුළ දීර්ඝකාලීනව පැවත එන කඩ 17 ක හිඟ ශේෂය රු.290,469 ක් ද පැරණි වෙළඳ සංකීර්ණයේ පැවති කඩ කාමර 4 ක 2007 හා 2013 වර්ෂවල සිට පවතින රු.151,369 ක හිඟ ශේෂයක්ද විය. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ කඩ කුලී අයකර ගැනීම කඩිනම් කළ යුතු වීම. |
| (ආ) | කඩ කාමර අංක 09 සඳහා මෙතෙක් ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර අංක 09 සඳහා ගිවිසුම් ගත විමට අදාල කටයුතු සිදුකර ඇති බව. | කඩ කාමරය බදු දීම සම්බන්ධයෙන් ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් බදු දීමේදී වර්ෂ 05 න් 05 ට බදු මුදල සංශෝධනය කිරීමට හෝ නගර සභා බල ප්‍රදේශවල තක්සේරු බදු මුදල සියයට 50 කින් වැඩි කර බදු මුදල සංශෝධනය කළ යුතු වුවත් බිම් කට්ටි 22 ක් වාර්ෂික බදු කුළිය තක්සේරු කිරීමේදී පවත්නා බදු කුලිය සියයට 10 ක ප්‍රතිශතයකින් එකතු කර බදු මුදල් සංශෝධනය කර තිබුණි. | ඉඩම් මැන වෙන් කල පසු තක්සේරුවට යොමු කර බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | ඉඩම් බදු දීමේදී වසර 5 න් 5ට බදු මුදල සංශෝධනය කිරීමට හෝ සියයට 50 කින් වැඩි කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | ලැබිය යුතු ණයගැති ශේෂය රු.4,519,896 ක් වූ අතර, එයින් වර්ෂ 1-3 ත් අතර කාලයක් වූ ගිණුම් ශේෂවල එකතුව රු.735,636 ක්ද වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂවල එකතුව රු.373,226 ක්ද විය. | මෙම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (ඇ) | ගෙවිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.26,625,762 ක් වූ අතර, එයින් වසර 1-3 ත් අතර කාලයක් වූ ගිණුම් ශේෂවල එකතුව රු.3,461,814 ක්ද වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ රු.638,258 ක ශේෂයක්ද විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 18 ක් බදු පදනම මත ව්‍යාපාරිකයන්ට ලබා දී තිබුණද , 2019 නොවැම්බර් 30 දින වන විටත් ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. | වෙළඳ සංකීර්ණයේ නව තක්සේරු මුදල කලක් යනතුරු කඩහිමියන් පිළිනොගැනිම හේතුවෙන් ගිවිසුම්ගත විම ප්‍රමාද වී ඇති බව. | නව තක්සේරුව මත ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශයේ අංක 575 දරන ගොඩනැගිල්ල සතු කඩ කාමර 04, මහජන ක්‍රීඩාංගණය ඉදිරිපිට සිදුකර ඇති ඉදිකිරීම සහ උප සභාපතිගේ නිවස පිටුපස සිදුකරන ලද අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගොඩනැගිල්ලේ අළුතින් කොටස් ඉදිකරන්නේනම් ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීති රීති ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට ඉතා අවම අගයකින් පවත්නා සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල වර්තමාන වෙළඳපල වටිනාකමට තක්සේරු කිරීම වෙනුවට සහා ආදායම් පරීක්ෂකවරයා විසින් රු.921,808,600 ක්ව තිබූ දේපල රු.58,450,000 ක් ලෙස තක්සේරු කිරීමට කටයුතු කර තිබුණි. | සභාව සතු සියලු වත්කම් ඉදිරියේ දී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | සභාව සතු දේපලවල අගය නිසි පරිදි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු.9,367,144 ක් වටිනා මෝටර් රථ දෙකක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නිලධාරීන්ගේ රාජකාරි කටයුතු සඳහා අපහසුතා පැන නැගීම වැලැක්වීමට වාහනය අලුත්වැඩියා කර භාවිතා කරන බව. | සභාව සතු වාහන නිෂ්කාර්යව තබා නොගෙන අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ කටයුතු කළ යුතු බව. |
| (ආ) | කොළඹ නුවර මාර්ගයේ පිහිටි පැරණි නගර සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට මේ වන විට රු.3,376,337 ක බදු මුදලක් ගෙවා තිබුණද එම ගොඩනැගිලි කිසිදු ඵලදායී ක්‍රියාමාර්ගයකට යොමු නොකර නිෂ්කාර්යව පවතී. | දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ බදු ගිවිසුම යාවත්කාලීන කර ගැනීම අවශ්‍ය බැවින් හා ඉඩම ද නගර සභාවට අවශ්‍ය බැවින් හිඟ බදු මුදල් සියල්ලම ගෙවා අවසන් කල බව. | බදු මුදල් ගෙවා ලබාගත් දේපලවලින් නිසි පරිදි ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික නිවසක මිදුල පුළුල් කිරීම හේතුවෙන් මාර්ගයට සිදුවන අලාභහානිය වැළැක්වීම සඳහා බව දක්වමින් රු.145,714 ක පොදු අරමුදල් භාවිතා කර පැති බැම්මක් පෞද්ගලික නිවසක ආරක්ෂාව සඳහා ඉදිකර තිබුණි. | එම ස්ථානයේ අනාරක්ෂිත බව අවම කිරීම සඳහා රුඳවුම් බැම්මක් ඉදි කිරීම අවශ්‍ය බවට තීරණය වී ඇති බව. | පෞද්ගලික දේපලවල ආරක්ෂාව සඳහා සභා අරමුදල් යොදවා ඉදිකිරීම් සිදු නොකලයුතු බව. |
| (ආ) | රු.849,831 ක් වැයකර 2020 වර්ෂයේ ඉදිකර තිබූ කඩුගන්නාව පල්ලිය පාර ආරක්ෂක බැම්ම කසිරු මාරුවට ඉදිකර නොතිබුණි. | බැම්ම සෑදීමේ දී වරින් වර පරීක්ෂා කර උපදෙස් දුන් බවත් පරීක්ෂා කරනු ලැබූ සෑම අවස්ථාවක ම බැම්ම ඉදි කිරීම නියමිත ආකාරයට සිදු කරනු ලැබ තිබුණු බව තාක්ෂණ නිලධාරීන්ට නිරීක්ෂණය වී ඇති බව. | සභා අරමුදල් වැය කර ඉදිකිරීම් සිදු කිරීමේදී නිසි තාක්ෂණයෙන් හා ප්‍රමිතියෙන් යුතු බව තහවුරු කරගත යුතු බව. |
| (ඇ) | අතුපැන්නවත්ත මාර්ගය සංවර්ධනය සඳහා රු.476,538 ක මුදලක් වැය කර ඉදිකර තිබූ කාණුව මාර්ගයේ අර්ධයකට පමණක් සකස් කිරීම හා ජලය මාර්ගය හරහා ගමන් කිරීමත් තුළින් මාර්ගයේ දිගුකල් පැවැත්ම තහවුරු වී නොතිබුණි. | මාර්ගය ඉදි කිරීමට පෙර ද පැරණි නිවසකට යාම සඳහා යොදා ඇති පිවිසුම් මගක් වන නිසා කාණු පද්ධතිය දීර්ඝ කරනු ලබන අවස්ථාවක එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී තාක්ෂණ හා මිනුම් වාර්තා අනුව ගෙවීම් කළ යුතු බව. |